# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

# Central Bank Pensioner s’ Association

# වාර්ෂික වාර්තාව

# Annual Report

# 2018

# ANNUAL REPORT 2018

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

# නිලධාරී මණ්ඩලය - 2018

| | |
|---|---|
| ගරු සභාපති | - ජයලාල් ජයවර්ධන මහතා |
| ගරු උප සභාපති | - ස්වර්ණා එස්.ඒ. ගුණරත්න මහත්මිය |
| ගරු ලේකම් | - ආරියදාස තන්ත්‍රිගේ මහතා |
| ගරු උපලේකම් | - කේ.එල්.පී.පී. රණතුංග මහත්මිය |
| ගරු උප ලේකම් | - ලීලා මෝහන සුන්දරම් මහත්මිය |
| ගරු භාණ්ඩාගාරික | - ආර්.ඩී. ගුණසේන මහතා |
| ගරු උප භාණ්ඩාගාරික | - ඒ.එම්.යූ. ටිකිරි බණ්ඩා මහතා |
| ගරු උප භාණ්ඩාගාරික | - එම්. මඩිගසේකර මහතා |
| ගරු විධායක කමිටුව | - පී. අරුන්දව නාදන් මහතා |
| | කේ.බී. දිසාකරුණා |
| | යූ.එල්.එම්. නවුෆර් මහතා |
| | හේමසිරි ෆර්ඩිනැන්ඩු මහතා |
| | (ප්‍රධාන සංස්කාරක සැදෑව) |
| | ආර්.එම්. සෙනවිරත්න මහතා |
| | (සංස්කාරක සැදෑව) |
| ගරු සමාජයීය ලේකම් | - ජගත් කාරියවසම් මහතා |
| ගරු ගිණුම් පරීක්ෂක | - කේ. ජෙගනාදන් මහතා |

**Central Bank Pensioners' Association**

# ANNUAL REPORT 2018

## ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය

**ආරියදාස තන්ත්‍රිගේ**
**104/8, ස්ටැන්ලි තිලකරත්න මාවත,**
**නුගේගොඩ.**

**දුරකථනය : 0112811049**
**ජංගම : 071 8064238**
**දිනය : 06/04/2019**

---

**සියළුම සාමාජික සාමාජිකාවන් වෙත,**

**<u>දැන්වීමයි.</u>**

අප සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම 2019 අප්‍රේල් මස 06 වන සෙනසුරාදා රාජගිරිය ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා බැංකුවේ, බැංකු අධ්‍යයන කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ.

එදින පෙරවරු 9.00 ට පැමිණීම ලියාපදිංචි කිරීම ආරම්භ වේ.

**න්‍යාය පත්‍රය**

01. සම්ප්‍රදායානුකූල පොල්තෙල් පහන දැල්වීම.
02. වියෝවූ සහෘදයන් වෙනුවෙන් විනාඩි දෙකක නිශ්ශබ්දතාවයක් පැවැත්වීම.
03. පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව කියවීම.
04. එම වාර්තාව සභා සම්මත කිරීම.
05. වාර්තාවෙන් පැන නැගෙන කරුණු ඇතොත් සාකච්ඡා කිරීම.
06. ගරු ලේකම් විසින් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම.
07. ගරු භාණ්ඩාගාරික විසින් වසරේ මූල්‍ය ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීම හා සභා සම්මත කිරීම.
08. ගරු සභාපතිගේ දේශනය.
09. යෝජනා ඉදිරිපත් කිරීම.

10. නව වසර සඳහා නිලධාරි මණ්ඩලයක් පත් කර ගැනීම.

11. වෙනත් කරුණු.

ලියාපදිංචි වීමෙන් අනතුරුව උදෑසන තේ පැන් සංග්‍රහය පැවැත්වෙන අතර මහා සභාවේ කටයුතු පෙ.ව. 9.00 ට ආරම්භ කරනු ඇත. මහා සභාවේ කටයුතු අවසන් වීමෙන් පසු සුහඳ හමුව හා දිවා භෝජනයද පැවැත්වෙනු ඇත. ඔබගේ ආදරණීය මිතුරු මිතුරියන් සමග පස්වරු 3.00 දක්වා රිසිසේ විනෝද විය හැකිය. මෙම අනගි අවස්ථාව සහභාගි වීමට ඔබ සැම මහත් උනන්දුවක් ගනු ඇතැයි අපි විශ්වාස කරමු.

ආරියදාස තන්ත්‍රිගේ

ගරු ලේකම්

සියළුම සාමාජික සාමාජිකාවන් වෙත,

## වාර්ෂික මහ සභා රැස්වීම - 2018

ඔබ සැමගේ දැනගැනීම සඳහා පහත සඳහන් ලියවිලි මෙම ප්‍රකාශනයෙහි ඇතුළත් කරමු.

01. වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමේ නිවේදනය.

02. 2018 වාර්ෂික වාර්තාව.

03. 2018 වාර්ෂික ගිණුම් වාර්තාව.

2019 අප්‍රේල් මස 06 වෙනි සෙනසුරාදා දින ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58, දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු අධ්‍යයන කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට නියමිත අපගේ වාර්ෂික මහා සභා රැස්වීමට පැමිණෙන ලෙස ඔබට කෙරෙන කාරුණික ඇරයුමයි. මහ සභා රැස්වීමෙන් අනතුරුව පැවැත්වෙන සුහඳ හමුව සහ දිවා භෝජන සංග්‍රහය (ඒ සඳහා අය කිරීමක් සිදු නොකරේ.) රැස්වීම් ශාලාව පිහිටි විදුපියසේදී පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත.

ආරියදාස තන්ත්‍රිගේ
ගරු ලේකම්

# 2018-2019 වාර්ෂික වාර්තාව

නෝනාවරුනි, මහත්වරුනි,

ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික සංගමයේ 2018-2019 වාර්ෂික වාර්තාව මෙසේ ඔබ අතට පත් කිරීමට ලැබීම ගැන බෙහෙවින් සතුටු වෙමි. අපගේ ජීවිත කාලයෙන් වැඩි කොටසක් මහ බැංකු සේවයේ නිරත වී සිටි අපි විශ්‍රාමිකයින් වශයෙන්ද විශ්‍රාමික සංගමයේ සෙවන යට ඒකරාශී වී තවත් කඩඉමක් පසුකිරීමේ දී ලැබූ අත්දැකීම් කෙටිකර පහත පළ කරන අතර, ලේකම්වරයා වශයෙන් මෙම වාර්තාව දෙවන වරටත් ඉදිරිපත් කිරීමට ලැබීම ගැන බෙහෙවින් සතුටු වෙමු.

පසුගිය වසරේ විශ්‍රාමික සංගමයේ විධායක කමිටුව 16 වතාවක් රැස්විය. එක් වතාවකදී මහ බැංකු අධිපතිවරයා හමුවූ අතර නියෝජ්‍ය අධිපති කේ.ඩී. රණසිංහ මහතා ඇතුළු පාලනාධිකාරිය සමඟ සාකච්ඡාවාර 3 ක් පැවැත්විය. වාර්තාගත සහභාගීත්වයක් සනිටුහන් කරමින් චාරිකා 2 ක්ද, පවත්වා ඇත. සංගමයේ සාමාජිකත්වය **1030** සිට **1154** දක්වා වර්ධනය වී ඇත. දායකත්ව මරණාධාර ක්‍රමයේ සාමාජික සංඛ්‍යාව **644** සිට **698** දක්වා වැඩි කරගෙන ඇත. මියගිය සාමාජිකයන් 29 ක් වෙනුවෙන් රු.725000/- මුදල් ප්‍රදානයක් සහ දායකත්ව අරමුදලෙන් රු.1010,000/- වශයෙන් හිමිකරුවන්ට ලබා දී ඇත. සාමාජිකයෙකු මියගිය විට රුපියල් ලක්ෂයක් ප්‍රදානය කිරීමේ ඉලක්කය මේ වනවිට අප සංගමය සපුරා ඇත. ඉහත ඉලක්කයන් සියල්ල සපුරා ගැනීම පසුගිය විධායක කමිටුව ලැබූ ජයග්‍රහනයන් වේ. ''සැදෑව'' කලාප 3 ක් නිකුත් කරමින් සාමාජිකත්වය දැනුවත් කිරීමේ කාර්ය ඉටුකර ඇත. ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ

අත්පොත 2018 මුද්‍රණ කටයුතු අවසන් කර මීළඟ මහ සභාවේ දී එනම් 2019 අප්‍රේල් 6 දින ඔබ අතට පත්කිරීමට අදහස් කරමි.

## <u>විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම.</u>

2018 වර්ෂයේ විශ්‍රාම වැටුප් වැඩිකිරීම සම්බන්ධව 2017.04.21 දින පැවැත්වූ මහ සභා රැස්වීමේදී වැඩි දෙනෙකුගේ අනුමැතියෙන් සම්මත කරගත් යෝජනාව පහත සඳහන් පරිදි වේ.

* 2015 වර්ෂය දක්වා විශ්‍රාම වැටුප යාවත්කාලීන කිරීම.
* 2018 සේවක වැටුප් වැඩි කිරීමෙන් 70% ක් විශ්‍රාමිකයන්ට ද ලබාදීම.
* මෙම ක්‍රමවේදයක් ලෙස ඉදිරියටත් අනුගමනය කිරීම.

2017 වාර්ෂික වාර්තාවේත් ''සැදෑව'' කලාපයේත් ඔබේ දැන ගැනීම සඳහා විස්තරාත්මකව මේ කරුණු පළකර ඇත. ඉහත ඉල්ලීම අධිපතිතුමා ඇතුළු පාලනාධිකාරිය වෙත යොමුකරන ලදී. විශ්‍රාම වැටුප් වැඩි කිරීමට අදාළව කරුණු පැහැදිලි කිරීමට පාලක පක්ෂය සමඟ ලිපි කිහිපයක් ද හුවමාරු කරගත්තෙමු. ඒ ලිපි වලින් කිහිපයක් ඔබේ දැන ගැනීම පිණිස 2018 ජූලි සැප්තැම්බර් ''සැදෑව'' සඟරාවේ පළ කොට ඇත.

මෙවර විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම සඳහා පාදක කරගැනීමට පසුගිය 2015 විශ්‍රාම වැටුප් සංශෝධනය එනම්, 2006 දක්වා විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය දැනගත යුතු බව විධායක කමිටුවේ අදහස විය. එමනිසා එම ක්‍රමවේදය පලනාධිකාරිය වෙතින් ඉල්ලුම් කළත් එය අප හට ලබා නොදුන් අතර ඒ පිළිබඳව අදාළ තොරතුරු එවකට වැඩ බැලූ සභාපති ලක්ෂ්මන් සිල්වා මහතාට ලබාදුන් බව පවසන ලදී.

2018.05.22 වන දින විශ්‍රාම වැටුප් සංශෝධනය පිළිබඳව නියෝජ්‍ය අධිපති රණසිංහ සහකාර අධිපති අශෝක හඳගම, මානව සම්පත් අධ්‍යක්ෂ අබේකෝන්, ලේකම් ඩී.ඩබ්. ජිනසේන යන මහ බැංකු පාලනාධිකාරිය හා නව විශ්‍රාමික විධායක කමිටුව අතර පළමුවන සාකච්ඡාව පැවැත්වුණි. සාකච්ඡාව ආරම්භයේදී සභාපති ජයලාල් ජයවර්ධන මහතා අපගේ ඉල්ලීම විස්තරාත්මකව ඉදිරිපත් කරන ලදි. මෙහිදී ඉදිරිපත් කර ඇති අපගේ වැටුප් යෝජනාවේ සාධාරණීයත්වය තහවුරු කිරීම සඳහා මහ බැංකු වාර්තාවේ සංඛ්‍යා ලේඛණ ගෙනහැර දක්වමින් බන්දුල විමලසූරිය මහතා කරුණු පැහැදිලි කරන ලදි. ශ්‍රෙදාණා රණතුංග මහත්මියත් ටිකිරි බණ්ඩා මහතාත් තම සේවා හා වෘත්තීය සමිති අත්දැකීමෙන් ලත් පරිචයෙන් සංඛ්‍යා ලේඛණ සහ කරුණු ඉදිරිපත් කරන ලදී.

2018 ඔක්තෝම්බර් 29 දින අධිපතිතුමා හමුවිය. අභිනවයෙන් තේරීපත් වුන කමිටුව ගරු සභාපති තුමා විසින් අධිපතිතුමාට හඳුන්වා දීම එදින දි සිදු කෙරින. අධිපති කාර්යාලයේ පැවති එම රැස්වීමට නියෝජ්‍ය අධිපති රණසිංහ මහතා, මානව සම්පත් කළමණාකරන අධ්‍යක්ෂ අබේකෝන් මහතා හා ඔහුගේ කාර්යය මණ්ඩලයත් සහභාගි විය. සාකච්ඡාව ආරම්භ කළේ සභාපති ජයලාල් ජයවර්ධන මහතායි. සියල්ල අසා සිටි අධිපතිතුමා අප සමඟ ඉතා සුහදව  කෙටි පිළිතුරු ලබාදුන් අතර වැටුප් වැඩි කිරීම සම්බන්ධව කරුණු ගෙනහැර පෑවේ නියෝජ්‍ය අධිපතිතුමායි. ඔහු ඉදිරිපත් කළ සමහර යෝජනා වලට අප එකග වූයේ නැත.

මෙහිදී නියෝජ්‍ය අධිපතිතුමා හා මානව සම්පත් අධ්‍යක්ෂ විසින් පැවසුවේ සියළුම විශ්‍රාමිකයින් පිළිබඳව වෙන වෙනම විස්තර රැස්කර ඇති බවත් ඒවා විශ්ලේෂණය කර 1997 ට පසුව ලබාදෙන වැඩිම විශ්‍රාම වැටුප ලෙස මෙවර වැඩිවීම ලබාදෙන බවයි. අධිපතිතුමා ද එය අනුමත කරමින්

කතාකරන ලදී. එම අවස්ථාවේදී අප කමිටු සභිකයින් අදහස් ප්‍රකාශ කර මින් කියා සිටියේ 2003 වසරේදී සියළුම විශ්‍රාමිකයින් සඳහා ජේ.එස්. ජයවර්ධන අධිපතිතුමා විසින් 20% ක්ද පසුගිය 2015 වසරේ අවමය රු.3500/= ක් වශයෙන් ද ලැබුන නිසා මෙවර අවමය මිට වඩා වැඩිවනු ඇතැයි උපකල්පනය කරන බවයි. කෙසේ වෙතත් අපේ ඉල්ලීම වනුයේ 2015 වසර සඳහා විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීම බව දන්වන ලදී.

2018 විශ්‍රාම වැටුප් වැඩි කිරීමේ ප්‍රතිශතයන් පිළිබඳව තොරතුරු අවසාන වරට 2018.12.20 වන දින ඉල්ලුම් කළත් අප වෙත මේ දක්වා (2019.01.18 වන විටත්) ලබාදී නොමැත. සාමාජිකයින් අප දැනුවත් කර ඇති තොරතුරු අනුව සමහර විශ්‍රාමිකයින්ගේ ඉදිරි වසර තුනක කාලය සඳහා ම මසකට වැඩි වී ඇති ප්‍රමාණය රු.700/= ක් තරම් වූ සොච්චමකි. 1997 ට පසුව ලබාදෙන බව කියූ හොඳම වැඩිවීම මෙය දැයි විමසමින් අධිපති තුමාගේ හා පාලනාධිකාරියේ අවධානය යොමු කරමින් ලිපියක් මේ වනවිටත් 2019.01.03 දාතමින් අප විසින් යවා ඇත.

## <u>මහ බැංකුව නියෝජනය කරමින් මියගිය විශ්‍රාමිකයින් වෙනුවෙන් මල්වඩම් යැවීම</u>

දිවයිනේ විවිධ ප්‍රදේශවල සිටින විශ්‍රාමිකයින් මියගිය කල්හි ශ්‍රී ලංකා මහ බැංකුවේ ශෝකය යනුවෙන් සඳහන් කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් මල්වඩමක් සකස් කර යැවීමේ වගකීම මහ බැංකු විශ්‍රාමික සංගමය විසින් සිදු කරනු ලබන සමාජ සත්කාරයකි. මෙම වගකීම පසුගිය වසර තුලදීම අප විසින් ඉටුකරන ලදී.

## <u>වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යාවත්කාලීන කිරීම.</u>

අප සංගමයේ සාකච්ඡා සහ සාමාජික සාමාජිකාවන් ලිඛිතව හා වාචිකව අප වෙත ඉදිරිපත් කළ යෝජනා ද සැළකිල්ලට ගෙන මහ බැංකු

විශ්‍රාමික විධායක කමිටුව විසින් සකස් කරන ලද වෛද්‍ය ප්‍රතිලාභ සංශෝධනය පිළිබඳව වූ යෝජනා මාලාව මහ බැංකු කාර්ය මණ්ඩල සේවා අධ්‍යක්ෂක තුමා වෙත ඉදිරිපත් කර කරුණු පැහැදිලි කරන ලදි. එහිදී වෛද්‍ය ප්‍රතිලාභ සංසෝධනය කිරීමේ අවශ්‍යතාවය පිලිගත් අධ්‍යක්ෂ වරයා බැංකු සේවාවේ ඇති සේවක සංගම් වල හා පාලනාධිකාරියේ අදහස් හා සාකච්ඡා කර නිගමනයකට පැමිණ යාවත්කාලීන කිරීමට නිර්දේශ කරන බවට එකඟ විය. රෝහල් ගාස්තු, පරීක්ෂණ ගාස්තු හා බෙහෙත් සඳහා යන මිල ගණන් ඉතාමත් ඉහළ මට්ටමක දැනට පවතින නිසා ඉතා ඉක්මණින් මෙම සංසෝධනය කරන ලෙසට අප ඉල්ලා සිටියෙමු.

## සංගමයේ දායකත්ව අවමංගල්‍ය සහනාධාර ක්‍රමය

පසුගිය සභාවාරයේදී රුපියල් ලක්ෂයේ ඉලක්කය උදෙසා සදුන් විජේසිරි මහතාගේත්, බී.එන්. ගුණපාල මහතාගේත් යෝජනා ස්ථිරත්වයෙන් රු.150/= බැගින් දායකත්ව මරණාධාර අරමුදල සඳහා දායක මුදල් අයකරනු ලැබේ. සාමාජිකයෙකු මියගිය විට සංගමයෙන් රු.25,000/= ක්ද දායකත්ව මරණාධාර ක්‍රමයට බැඳී වසරක් ඉක්මවූ අයෙකු නම් රු.75,000/= ක්ද ලෙස එකතුව රුපියල් ලක්ෂයක් දෙනු ලැබේ. මේ වනවිට එම ඉලක්කය සම්පූර්ණ කර ගැනීමට හැකිවීම ගැන සතුට පළ කරමු.

## මහ බැංකු ඛේදවාචකයේ 23 වන අනුස්මරණ වැඩසටහන

1996 බෝම්බ ප්‍රහාරයෙන් මියගිය සහෘදයින් සිහිපත් කිරීමට මෙන්ම තුවාල ලැබූවන්ට සෙත් පැතීමටත් ප්‍රහාරයෙන් ඇද වැටෙන්නට ගිය මහ බැංකුව ඉන්ද්‍රඛීලයක් මෙන් යළි නඟා සිටුවීමට උරදුන් සැමට උපහාර

දැක්වීමත් සනිටුහන් කෙරෙන මෙම උත්සවයට පූර්ණ සහභාගීත්වය දැක්වීමට විශ්‍රාමික සංගමය තීරණය කරන ලදී.

මෙම සිදුවීම කාලයේ වැලිතලාවෙන් වැසී යාමට ඉඩ නොතැබීමටත් ඇද වැටීම හෝ ව්‍යසනය ඉදිරියේ නැගී සිටීමටත් මහ බැංකු සේවකයා සතු ජීවගුණය සහ අප්‍රතිහත ධෛර්යය නොනැසී පවත්වා ගැනීම කාලීන අවශ්‍යතාවයක් බව පෙන්වා දීම අපගේ දැක්ම විය. ඉතිහාසය ඇත්තේ කියවන්නට පමණක් නොව ඉන් ලබාගත් පන්නරය රැකගෙන ඒ තුළින් කාලීන අර්බුද ජය ගැනීමට මග හෙළිකර ගැනීමටත් ය.

2018 සමස්ත වැඩසටහන කෙරෙහිම අවධානය යොමුකළ විශ්‍රාමික සංගමය, බෞද්ධ සංගමය සංවිධානය කළ ධර්ම දේශනාව හා දානමය පිංකමට ද කොච්චිකඩේ කෝවිලේ පැවැත්වූ හින්දු ආගමික මෙහෙයට ද ක්‍රිස්තියානි සංගමයේ දේව මෙහෙයට ද කොටුව ජුම්මා මුස්ලිම් දේවස්ථානයේ ආගමික මෙහෙයට ද සක්‍රීය දායකත්වය සපයන ලදී.

මහරගම අපේක්ෂා රෝහල (පිළිකා රෝහල), රෝගීන් වෙත 2019 ජනවාරි 27, 28, 29, 30, 31 යන දිනවල දිවා ආහාරය සැපයීමෙන් ද මියගිය සොයුරු සොයුරියන්ට පිං පමුණුවන ලදී.

**<u>වියපත් බුහුමන්</u>**

ශ්‍රී ලංකා මහ බැංකුවේ කීර්තිය අභිමානය හා ගෞරවය සුරැකි සාමාජික සාමාජිකාවන් කිහිප දෙනෙකුගේ සුවදුක් විමසීමට විධායක කමිටුව පසුගිය වසරේ මෙන්ම මෙවර ද අමතක නොකළ අතර ඔවුන්ගේ සුවදුක් විමසන විට සතුටු කඳුලු වගුරනු ද දුටිමු.

## ''සැදෑව'' සඟරාව

''සැදෑව'' සඟරාවේ කලාප 3 ක් මෙම කාලය තුළ නිකුත් විය. මහ බැංකු විශ්‍රාමිකයා සතු ප්‍රශ්න හා ගැටළු පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් ''සැදෑව'' පවත්වාගෙන යාම සංගමයේ පරමාර්ථය විය. එසේම සැම විටම පුවත් සඟරාවක තිබිය යුතු පුවත් වටිනාකම කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වන ලදි. 2018 ජූලි-සැප්තැම්බර් කලාපය නිකුත් කිරීම ප්‍රමාදවූයේ විශ්‍රාම වැටුප් වැඩිවීම පිළිබඳ නවතම තොරතුරු ඔබ වෙත ලබාදීමට අපේක්ෂා කරමින් සිටි නිසාය. සැදෑව සඟරාව ඔබ අතට පත්කිරීමට කටයුතු කරනුයේ සංස්කාරක හේමසිරි පර්ඩිනැන්ඩු, පී. අරුන්දවනාදන් හා ආර්.එම්. සෙනෙවිරත්න මහත්වරුන් විසිනි.

## එක්දින චාරිකාව :

මෙම සුහද හමුව 2018 සැප්තැම්බර් 22 වන දින යක්කල අමායා ග්‍රීන් හෝටලයේදී පැවැත්වුනි. සුඛෝපබෝගී බස්රථ දෙකකින් මාගී දෙකක් ඔස්සේ පෙ.ව. 10 ට පමණ පැමිණි පිරිස සවස් වන තෙක් විනෝද විය. සංගීතය, ප්‍රණීත දිවා ආහාරය සැමදෙනා පිනවීය. පද්මිනි විජේරත්න මිය මෙහෙයවූ තරඟ ඉසව් ද අමරපාල කරසිංහ ආරච්චි මහතාගේ කථනයෙන් ද සභාපති ජයලාල් ජයවර්ධන මහතාගේ කෙටි දෙසුමෙන්ද මෙම හමුව සමන්විත විය. ලබන වසරේදී එක්දින චාර්තාව කොළඹදී පැවැත්වීමට තීරණය කළෙමු.

## තුන්දින චාරිකාව

පසුගිය වර්ෂයේ තුන් දින චාරිකාව නාගදීපය ඇතුළුව යාපනය අර්ධද්වීපයේ වැදගත් ප්‍රදේශ ආවරණය වන පරිදි 2018 මාර්තු මස 28, 29 සහ 30 වන දිනයන්හි සිදු විය. මෙතෙක් චාර්තාගත වැඩිම සහභාගීත්වය

සනිටුහන් කරමින් 100ක් පමණ පිරිසක් මෙයට සහභාගි වූහ. සුඛෝපභෝගී බස් රථ දෙක සඳහා වියදම රු. 288,400/- ක් දරණ ලද්දේ ශ්‍රී ලංකා මහ බැංකුව විසිනි.

මේ වසරේ තුන්දින චාරිකාව 2019.03.01, 02, 03 දිනවල ත්‍රිකුණාමලය සුඛෝපභෝගී අනත්තාමා හෝටලයේ නවාතැන් ගෙන ගත කලා. තිරියාය, හමුදා කඳවුර හා වරාය බෝට්ටු සංචාරය, නිලාවැලි බීච්, කෝනේෂ්වර කෝවිල, කින්නියා උණුවතුර ලිං, සේරුවාවිල, සෝමාවතිය ආදී ස්ථානවල සංචාරය කරන ලදී.

**<u>සමාප්තිය :-</u>**

පසුගිය වසරේ විධායක කමිටු කාලය තුළ ජයග්‍රහණ ලබා ගැනීම් පිටුපස අමතක කළ නොහැකි විශාල පිරිසක් විය. ඒ අතර මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා, නියෝජ්‍ය අධිපති කේ.ඩී. රණසිංහ මහතා, මානව සම්පත් කළමණාකාර අධ්‍යක්‍ෂ අබේකෝන් මහතා, කාර්ය මණ්ඩල සේවා කළමණාකාර අධ්‍යක්‍ෂ සරත්චන්ද්‍ර මහතා, ලේකම් ජිනසේන මහතා හා කුසුම් දිසානායක මහත්මිය, සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ෂෙලොම් ගුණවර්ධන මෙනවිය, පහසුකම් සැපයීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ආරක්ෂ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක , රාජගිරිය විදු පියසේ මුද්‍රණාලාධිපති හා ආයතනයේ සියළුම කාර්ය මණ්ඩලයත් සිහිපත් කරමි. වියපත් වූවන්ට අපහසුතාවකින් තොරව පුරා තෙදිනක් සංචාරයේ යෙදීමට සුඛෝපභෝගී බස්රථ දෙකක වියදම දැරීමෙන් හා විශ්‍රාමික සංග්‍රමයේ විධායක කමිටු රැස්වීම පැවැත්වීමට සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ලේ පරිශ්‍රය ලබාදීමෙන් මෙන්ම සංවත්සර මහා සභා රැස්වීම මහ බැංකු විදු පියස ගෙවීමක් කිරීමකින් තොරව ලබාදීම තුළින් ද ''සැදෑව'' සඟරාව නොමිළයේ මුද්‍රණය කර දීමෙන් ද, විශ්‍රාමිකයින් මහ බැංකුවට අමතක කළ නොහැකි පාර්ශවයක් ලෙස සළකා

අප වෙත දැක්වූ සුහදශීලිභාවය වෙනුවෙන් විශ්‍රාමික සංගමය පළමුවෙන් ඉහත සඳහන් සියළුම දෙනා වෙත අපගේ කෘතඥතාවය පළකර සිටී.

දායකත්ව මරණාධාර අරමුදල පිළිබඳ යෝජනාව ඉදිරිපත් කර එය ක්‍රියාත්මක කල හැකි ක්‍රමවේදය ඔබට හඳුන්වා දී අපමණ වෙහෙසක් දරමින් එය ගොඩනැගීමට උත්සාහ ගත් එසේම විශ්‍රාමික වැටුප් සංශෝධනයේ මූලික පදනම සකස් කරමින් ආරම්භයේ එම සටන මෙහෙයවූ අද අප අතර නොමැති බන්දුල විමලසූරිය මහතාගේ සේවය අගයමින් ඔහුට ස්තූතිය පුද කරමි. එසේම අප කමිටුවේ උප සභාපතිවරයෙකු ලෙස කටයුතු කරමින් සිට අනපේක්ෂිත මොහොතක අප අතරින් වියෝ වූ ඩී.ඩී.ඒ. ධර්මකීර්ති මහතා ලබාදුන් ක්‍රියාකාරී සහයෝගය පිළිබඳව ද ස්තූති පූර්වකව සිහිපත් කරමි. එසේම ''සැඳෑව'' සඟරාව සංස්කරණයේදී රටා නිමැවුම් වලින් නව මාවතකට ගෙනගිය හේමසිරි ෆර්නෑන්ඩු මහතාටත්, සහය දැක්වූ ර.මු. සෙනෙවිරත්න මහතාටත් මගේ ස්තූතිය පිරිනමමි. වසර ගණනාවකට පසුව විශ්‍රාමික සාමාජික සාමාජිකාවන්ගේ ඡායාරූප හා ලිපිනයන් ඇතුළත් නව අත්පොතක් සකස් කිරීමට කටයුතු කළ කේ.බී. දිසාකරුණා මහතාටත් ඔහුට සහය වූ ආර්.ඩී. ගුණසේන මහතාටත් මගේ හදපිරි තුති. ගිණුම් කටයුතු විගණනය කළ ජෙගනාදන් මහතාට, ගිණුම් කටයුතුවලට අමතරව සංගමයේ අන් සියළුම කටයුතු වලදී ඉදිරිපත් වී කටයුතු කරන භාණ්ඩාගාරික ගුණසේන මහතාට උප සභාපති ස්වර්ණා මහත්මියට හා සභාපති ජයලත් මහතාට සමාජීය ලේකම් ජයත් කාරියවසම් මහතාට හා පී. අරුන්දවනාදන් මහතාටත්, ලීලා මෝහන සුන්දරම් මහත්මියට, යූ.එල්.එම්. නවුෆර් මහතාට, එම්. මඩිගසේකර මහතාට දැක්වූ සහයෝගයට ස්තූතිය පළකරමි. සැදෑව සඟරාවට ලිපි එවූ සියළු දෙනාට ස්තූතිවන්ත වෙමි. සංගමයේ ප්‍රධාන පරමාර්ථ සහ ප්‍රතිපත්ති මත පිහිටා ක්‍රියාකිරීමට ශක්තිය ලබාදීම පිළිබඳව සියළුම සාමාජිකත්වයට ප්‍රණාමය පුද කරමි.

මහ බැංකු විශ්‍රාමිකයන්ගේ අත්පොත මුද්‍රණයට සංගමයේ මුදල් වියදම් නොකර එහි පිරිවැය අනුග්‍රාහකයන්ගෙන් ලබා ගැනීමට සභාපතිතුමා හා ලේකම්තුමා ගත් උත්සාහය ඉතා සාර්ථක විය. විශ්‍රාමික ඩී. ජයවර්ධන මහතා, සුසන්ත ලියනගේ මහතා හා ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති වර්තමාන කොමර්ෂල් බැංකුවේ සභාපති සිංහ ධර්ම ධීරසිංහ මහතාත්, ජනාධිපති මාවතේ හැටන් නැෂනල් බැංකුවේ කළමණාකාරතුමාටත්, නුගේගොඩ ලෝටස් සංචාරක සමාගමටත් මෙම පොත මුද්‍රණය කිරීමේදී මූල්‍යමය ආධාර ලබා දීමෙන් අප සංගමයට කළ මෙහෙවර බෙහෙවින් අගය කරමු. ලේකම්ගේ වාර්තාව කියවා සෝදුපත් කියවා දුන් ටිකිරි හා ශ්‍රද්ධා සොයුරු සොයුරියන්ට ද ස්තූතිය පළ කරමි.

## <u>යෝජනා</u>

1. රාජ්‍ය ප්‍රතිපත්තියට අනුරූප වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතා ගැටළුවට 2015 වර්ෂයේදී ලබාදුන් සාධාරණ විසඳුම් පරිපූර්ණත්වයට පත්කිරීම සඳහා පහත අදහස් යෝජනා ක්‍රියාත්මක කරන ලෙස මහ බැංකු අධිපතිතුමා ඇතුළු මුදල් මණ්ඩලයෙන් මෙම මහ සභාව ඉල්ලා සිටී.

   I. වර්තමානයේ 2006 දක්වා යාවත්කාලීන කරඇති මහ බැංකු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප 2018 දක්වා යාවත්කාලීන කිරීම.

   II. මීට පසුව සේවක වැටුප් වැඩි කරන සෑම අවස්ථාවකම එම ප්‍රමාණයෙන් 70% ක ප්‍රතිශතයක් විශ්‍රාමිකයින්ට ලබා දී එය ප්‍රතිපත්තියක් ලෙස ඉදිරියට ගෙන යෑම.

   III. පසුගිය විශ්‍රාම වැටුප් සංශෝධනයේදී ප්‍රතිපත්තිමය වශයෙන් ප්‍රතිශතාත්මක වැඩිවීමකට විධායක කමිටුව දිගින් දිගටම

අකමැත්ත පළ කරමින් යාවත්කාලීන කිරීම සඳහා කරුණු දක්වද්දි පාලනාධිකාරිය විසින් 1.5% බැගින් වැඩි අඩු ප්‍රතිශතාත්මක වැඩිවීමක් ලබාදීම නිසා ඇතිවූ සමහර සාමාජිකයන්ට රු.700/= ක් තරම් අඩු සොච්චමක් ලැබී ඇත. අධිපතිතුමා ඉදිරියේ විශ්‍රාම වැටුප් වැඩිකිරීම අන්තර් දීමනාවක් ලෙස සළකන බව අප සඳහන් කළ නිසා නිවැරදිව වැටුප් යාවත්කාලීන කරන තෙක් සුළු වැඩිවීමක් ලැබූ අයට සාධාරණ ගෙවීමක් කරන ලෙස ඉල්ලා සිටිමු.

IV. වර්තමානයේ විශ්‍රාම වැටුප් ලබාගන්නා ප්‍රමාණය පිළිබඳ තොරතුරු දැන ගැනීමට ඇති අයිතියට ගරු කිරීමක් වශයෙන් 2006 යාවත්කාලීන කරන ලද විශ්‍රාමිකයින්ගේ වැටුප් තලය පිළිබඳ තොරතුරු එක් එක් විශ්‍රාමිකයාට ලබාදීම.

**යෝජනාකරු : විධායක කමිටුව**

**2. සාමාජික ගාස්තු**

මුදල අවප්‍රමාණය වීම නිසා වියදම වැඩිවී ඇති නිසාද අනාගතයේ විදු පියසේ මුද්‍රණාලය වසා දැමීමට මහ බැංකුව අදහස් කරන නිසා ''සැදෑව'' මුද්‍රණය සඳහා වියදමක් දැරීමට සිදුවන නිසා ද, සාමාජික ගාස්තුව රු.100/= සිට රු.150/= දක්වා වැඩි කිරීමට මේ මහා සභාව යෝජනා කර සිටී.

**යෝජනාකරු : විධායක කමිටුව**

**3. වෛද්‍ය ප්‍රතිලාභ සංශෝධන යෝජනා**

I. විශ්‍රාමික සංගමයේ විධායක කමිටුව විසින් සකස් කර ඉදිරිපත් කර ඇති යෝජනාවල ඇති සංශෝධනයන් වහාම ක්‍රියාත්මක කරන ලෙස මේ මහා සභාව ඉල්ලා සිටී.

II. Cat C, D, E කාණ්ඩය සඳහා ඇතුළත් නොවූ අයට නැවත ඇතුළුවීමට අවස්ථාවක් ලබා දීමට අවස්ථාවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිමු.

III. Cat C, D, E සඳහා ජීවිතයට එක් වරක් පමණක් ලබාදෙන ප්‍රමාණයෙන් වරක් පාවිච්චි කළ විට පසුව එය වැඩි වූ ප්‍රමාණය නැවත වරක් අවශ්‍ය වූ අවස්ථාවක ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමු.

**යෝජනාකරු : විධායක කමිටුව**

4. මහ බැංකු විශ්‍රාමික සංගමය මගින් සංවිධානය කරන චාරිකා සඳහා යන වියදම් ගමනේ යෙදෙන සාමාජිකයන්ගෙන්ම පියවාගැනීමට උපරිම උත්සාහ ගතයුතු අතර අවශ්‍යම අවස්ථාවක් වුවහොත් පමණක් සංගමයෙන් ප්‍රතිපූර්ණ කල හැක. නමුත් එය ඉතාමත් අඩු ප්‍රමාණයකට සීමා කළ යුතුය.

**යෝජනාකරු විධායක කමිටුව**

1996 දී ත්‍රස්තවාදීන් මහ බැංකුව වෙත එල්ල කරනු ලැබූ බෝම්බ ප්‍රහාරයෙන් මියගිය හා සදා ආබාධිත වූ සේවක සේවිකාවන්ගේ දූ දරුවන්, මහ බැංකුවේ සේවක පුරප්පාඩු සඳහා අයදුම් පත් ඉදිරිපත් කල විට, එම තනතුරුවලට අදාල අධ්‍යාපන සුදුසුකම් **<u>තිබේ නම් පමණක්</u>** හා ඒ සඳහා යම් විභාගයක් **<u>වෙතොත්, එයින්ද සමත්වන</u>** අයට, සානුකම්පිතව සලකා බලා එම දරුවන් මහ බැංකු සේවයට බඳවා ගන්නා ලෙස අධිපතිතුමාට සහ පාලක පක්ෂයට ඉල්ලීමක් කරන ලෙස යෝජනා කරමු.

යෝජනාව :- ආරියදාස තන්ත්‍රිගේ (වි.අ. 3806)
ස්ථිර කිරීම :- ජගත් කාරියවසම් (වි.අ. 1215)

වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වූ සුලු පිරිසකට තවමත් වෛද්‍ය ප්‍රතිලාභ හිමිකම් නොමැත. මහ බැංකුව මුලදී ප්‍රතිපත්තියක් ලෙස වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වූ අයට වෛද්‍ය ප්‍රතිලාභ අහිමි කර තිබූ අතර පසුව ඉල්ලුම් කළ වැඩි පිරිසකට නැවත ලබාදී ඇත. තරුණ සමයේ තම ශ්‍රමය මහබැංකුවට කැප කර සැදෑ සමයේ අසරණව වයෝවෘද්ධව ඉතිරිව සිටින මේ සුලු පිරිසද නොසළකා හැරිය නොහැක. එම නිසා ඉතිරි සුලු පිරිසටද වෛද්‍ය ප්‍රතිලාභ හිමිකම් ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමු.

යෝජනාකරු :- කේ.ආර්. විජේවික්‍රම (වි.අ. 498)
ස්ථිරකරු :- කේ.ඒ.යූ. පෙරේරා (වි.අ. 3276)

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ සාමාජිකත්වය වෙත ඉදිරිපත් කරනු ලබන

## ගරු ස්වාධීන විගණකගේ වාර්තාව

මා වෙත ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ 2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ ශේෂ පත්‍රයන් ආදායම්, වියදම් ගිණුමත් පැහැදිලි කිරීමේ සටහනුත් විගණනයට භාජනය කරන ලදී.

මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට අවශ්‍ය කරන සියලුම පැහැදිලි කිරීම් හා තොරතුරු මා විසින් ලබා ගන්නා ලදී. ඉදිරිපත් කරන ඇති මූල්‍ය ප්‍රකාශනයන් පිළිගත හැකි තත්ත්වයෙන් ඉදිරිපත් කර තිබූ අතර ඒවා බලපෑම් කළ හැකි තරමේ මඟහැරීම්වලින් හා වංචා හෝ වැරදිවලින් නිදහස්ය.

මා විසින් කරන ලද විමර්ශනයේ හැටියට සංගමය විසින් විධිමත්ව හා නිවැරදිව තොරතුරු පවත්වාගෙන ගොස් ඇති අතර 2018 දෙසැම්බර් මස 31 දිනට ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන මගින් සත්‍ය හා නිවැරදි තොරතුරු ප්‍රකාශනයන් පිළිබිඹු කරන අතර එම දිනෙන් අවසන් වන වසර සඳහා නිවැරදි ආදායම් තත්වයක් දක්වා ඇත.

අත්සන් කළේ ෘ කේ.ජෙගනාදන්<br>
2019-03-01<br>
ගරු විගණක

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

## 2018.12.31 දිනට අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම.

| úhou | සටහන | 2018 | 2017 | ආදායම | 2018 | 2017 |
|---|---|---|---|---|---|---|
| සංගමයේ සහනාධාර | | | | සාමාජික ගාස්තු | 1257000 | 1287700 |
| මහසභා රැස්වීම | 1 | 289050 | 157765 | වැන්දඹු අනත්දරු | 63000 | 84700 |
| තුන්දින චාරිකාව | 2 | - | 30250 | | | |
| එක්දින චාරිකාව | 3 | 114160 | 46795 | දායකත්ව මරණාධාර අරමුදල | | 730900 |
| පරිත්‍යාග | | | | | | |
| මරණාධාර | 4 | 725000 | 550000 | පොලී ආදායම | | |
| දායකත්ව මරණාධාර | - | - | 898000 | හැ.නැ.බැ. ස්ථාවර තැන්පතු | 294845 | 237257 |
| රෝගී සාමාජිකයන් හමුවීම | | | 11000 | හැ.නැ.බැ. ඉතිරි කිරීම | 1698 | 1672 |
| | | | | හැ.නැ.බැ. භාණ්ඩාගාර බිල්පත් | 93269 | 107351 |
| | | | | සම්පත් බැ. භාණ්ඩාගාර බිල්පත් | 13480 | 13546 |
| | | | | සම්පත් ඉතිරි කිරීම | 7781 | 6692 |
| අනෙකුත් වියදම් | 5 | | | | | |
| ආගමික කටයුතු | | 80568 | - | | | |
| තැපැල් ගාස්තු හා මුද්දර | | 72756 | 72670 | | | |
| පිටපත්, ටයිප්, මුද්‍රණ | | 36858 | 21713 | | | |
| ප්‍රවාහනය | | 18542 | 40088 | | | |
| මල්වඩම් වියදම් කපා හැරීම | | 18050 | 24865 | | | |
| සංග්‍රහ වියදම් | | 16948 | 5785 | | | |
| විවිධ වියදම් | | 16600 | 2430 | | | |
| සැදෑව | | 10608 | 23185 | | | |
| ප්‍රාදේශීය සංවිධාන | | 7640 | 14595 | | | |
| වෙබ් අඩවිය | | 5000 | 5000 | | | |
| ලිපි ද්‍රව්‍ය | | 4204 | 13625 | | | |
| බැංකු ගාස්තු | | 900 | 1500 | | | |
| ක්ෂයවීම් | | 90 | 100 | | | |
| වියදමට වැඩි ආදායම | | 314099 | 550452 | | | |
| එකතුව | | **1731073** | **2469818** | | **1731073** | **2469818** |

සභාපති භාණ්ඩාගාරික ගිණුම් පරීක්ෂක

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
## 2018.12.31 දිනට ශේෂ පත්‍රය

| වගකීම් | 2018 | 2017 | වත්කම් | 2018 | 2017 |
|---|---|---|---|---|---|
| සමුච්චිත අරමුදල | 5101608 | 4551156 | කාර්යාලීය උපකරණ | 813 | 903 |
| වියදමට වැඩි ආදායම | 314099 | 550452 | ආයෝජන | | |
| | | | ස්ථාවර තැන්පතු හැ.නැ.බැ | 3396871 | 3107671 |
| | | | භාණ්ඩාගාරික බිල්පත් හැ.නැ.බැ | 1308183 | 1214914 |
| | 6210 | 6210 | භාණ්ඩාගාර බිල්.සම්පත් බැංකුව | 146452 | 146453 |
| අවශ්‍ය පුද්ගලයින් සඳහා වූ අරමුදල | | | ජංගම වත්කම් | | |
| විශ්‍රාමිකයන්ගේ බැංකු අතපොත | 75000 | - | | 53958 | 48313 |
| සඳහා අනුග්‍රහයකයෝ | 60750 | - | ලැබිය යුතු පොලිය හැ.නැ.බැ. | 87750 | 65600 |
| දායකත්ව මරණාධාර අරමුදල | | | මල් වඩම් සඳහා ලැබිය යුතු (ම.බැ) | | |
| | | | බැංකු ශේෂයන් | 307118 | 282377 |
| | | | හැ.නැ.බැ ජංගම ගිණුම | 53545 | 51846 |
| | | | හැ.නැ.බැ ඉතිරිකිරීමේ ගිණුම | 183975 | 162714 |
| | | | සම්පත් බැංකු ඉතිරිකිරීම් ගිණුම | 19002 | 27027 |
| | | | අතැති මුදල් | | |
| | **5557667** | **5107818** | | **5557667** | **5107818** |
| එකතුව | | | | | |

සභාපති　　　　භාණ්ඩාගාරික　　　　ගිණුම් පරීක්ෂක

**සටහන 1** 2018 අප්‍රේල් 21 දින ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 58 දරණ මහ බැංකු විදුපියස ශ්‍රවණාගාරයේ දී පැවැත්වූ මහා සභා රැස්වීමේ දරණ ලද වියදම්.

| | |
|---|---|
| සංග්‍රහ දීමනා (පෙරවරු සහ දිවා ආහාර) | රු. 217,750.00 |
| වාර්ෂික වාර්තාව සඳහා | රු. 60,500.00 |
| වෙනත් වියදම් | රු. 10,800.00 |
| මුළු එකතුව | රු. 289,050.00 |

**සටහන 2** 2018 මාර්තු 28 - 30 දක්වා යාපනයේ තුන්දින චාරිකාව සඳහා වූ වියදම් පහත දැක්වේ.

මෙහිදී ප්‍රවාහන පහසුකම් සලසාදීම සඳහා මහ බැංකුව විසින් රු. 288, 400.00 ක සහනාධාරයක් ලබා දී ඇත.

| | | |
|---|---|---|
| සියලු ලැබීම් | | රු. 928,685.00 |
| **වියදම්** | | |
| නවාතැන් සහ හොටෙල් ගාස්තු | රු. 784,822.00 | |
| අනෙකුත් වියදම් | රු. 143,863.00 | |
| මුළු වියදම | | රු. 928,685.00 |

**සටහන 3** 2018 සැප්. 2 2 දින එක් දින චාරිකාව සහ සුහද හමුව යක්කල ආසන්නයේ,

වීරගුල පිහිටි අමායා ග්‍රීන් හෝටලයේදී පැවැත්විය. ඒ සඳහා වූ වියදම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| සියලු ලැබීම් | රු. 315,000.00 | |
| **වියදම්** | | |
| දිවා ආහාර සහ හොටෙල් ගාස්තු | රු. 342,300.00 | |
| ප්‍රවාහන වියදම් | රු. 50,000.00 | |
| සංගීතය | රු. 15,000.00 | |
| වෙනත් වියදම් | රු. 21,860.00 | |
| | | රු. 429,160.00 |
| සංගමයේ සහනාධාරය | | රු. 114,160.00 |

**සටහන 5** ආගමික කටයුතු සඳහා වියදම්

මහ බැංකුවේ බෝම්බ ප්‍රහාරයෙන් මියගිය අය වෙනුවෙන් ආගමික කටයුතු සඳහා රු.80,568.00 වියදම් විය.

| | |
|---|---|
| 2018.01.31 දිනට විවිධ ආගමික කටයුතු සඳහා | රු. 45,668.00 |
| 2018.01.31 දිනට ජනවාරි 27,28,29,30,31 මහරගම අපේක්ෂා රෝහලේ දිවා ආහාරය වෙනුවෙන් | රු. 35,000.00 |
| | රු. 80,568.00 |

**සටහන 4** 2018 වර්ෂය තුලදී මරණාධාර වශයෙන් සහ දායකත්ව මරණාධාර අරමුදලින් පහත සඳහන් මියගිය සාමාජිකයින් වෙනුවෙන් අදාල ගෙවීම් කර ඇත.

| | වි.අංකය | නම | මරණාධාර අරමුදල | දායකත්ව මරණාධාර අරමුදල | මුළු මුදල |
|---|---|---|---|---|---|
| 01 | 1210 | ඒ.ඒ. විජේවර්ධන මිය | 25000/- | | 25000/- |
| 02 | 350 | බී.පී.එම්. ප්‍රනාන්දු මිය | 25000/- | | 25000/- |
| 03 | 532 | ජේ.එම්.ඒ.එම්. ජයමාන්න මයා | 25000/- | | 25000/- |
| 04 | 1442 | ඩී.ඩබ්.ඩබ්.ඒ.පී. පියසේන මයා | 25000/- | 65000/- | 90000/- |
| 05 | 3303 | ආර්. සුනිල් මයා | 25000/- | | 25000/- |
| 06 | 3366 | ඩබ්.ඒ. පියදාස මයා | 25000/- | 65000/- | 90000/- |
| 07 | 195 | ඩබ්.එච්. ආටිගල මිය | 25000/- | 65000/- | 90000/- |
| 08 | 933 | එන්.එස්. විජේපාල මයා | 25000/- | 65000/- | 90000/- |
| 09 | 193 | පී. එම්. හසාන් මයා | 25000/- | | 25000/- |
| 10 | 453 | එන්.පී. පෙරේරා මයා | 25000/- | | 25000/- |
| 11 | 950 | ආර්.පී. චන්ද්‍රසේන මයා | 25000/- | 75000/- | 100000/- |
| 12 | 1376 | ආර්. රණසිංහ මයා | 25000/- | 75000/- | 100000/- |
| 13 | 597 | ඒ.එස්. ජයවර්ධන මයා | 25000/- | | 25000/- |
| 14 | 635 | සී.ඊ. ජයසූරිය මයා | 25000/- | 75000/- | 100000/- |
| 15 | 938 | බී.පී. විමලසූරිය මයා | 25000/- | | 25000/- |
| 16 | 662 | එස්. කරුණාරත්න මයා | 25000/- | | 25000/- |
| 17 | 731 | ආසිරි පෙරේරා මයා | 25000/- | 75000/- | 100000/- |
| 18 | 683 | බැසිල් සෙනෙවිරත්න මයා | 25000/- | | 25000/- |
| 19 | 1451 | ඩී.ඩී.ඒ. ධර්මකීර්ති මයා | 25000/- | 75000/- | 100000/- |
| 20 | 1038 | ඩබ්.එම්. සිරිවර්ධන මයා | 25000/- | | 25000/- |
| 21 | 519 | එස්.එන්.සී. සන්තියාගො මයා | 25000/- | | 25000/- |
| 22 | 795 | පී. සුන්ද්‍රනාතන් මයා | 25000/– | | 25000/- |
| 23 | 3299 | වී.එස්.එල්. ද මෙල් මයා | 25000/- | 75000/- | 100000/- |
| 24 | 818 | ඩබ්.පී. චන්ද්‍රසේන මයා | 25000/- | | 25000/- |
| 25 | 852 | එස්.පී.එස්. ගුණසේකර මිය | 25000/- | 75000/- | 100000/- |
| 26 | 396 | ඕ.පී.එන්. කෝට්ටච්චි මයා | 25000/- | | 25000/- |
| 27 | 751 | එස්.ආර්.එම්. සිරිසේන මයා | 25000/- | 75000/- | 100000/- |
| 28 | 868 | පී. සිරිසේන මයා | 25000/- | 75000/- | 100000/- |
| 29 | 765 | පී.වී.බී. අලගකෝන් මයා | 25000/- | 75000/- | 100000/- |
| | | | 725000/ | 1010000/ | 1735000/ |

# ANNUAL REPORT 2018

# CENTRAL BANK PENSIONERS' ASSOCIATION

## Office Beares - 2018

| | |
|---|---|
| Hony. President | - Mr. Jayalal Jayawardena |
| Hony. Vice President | - Mrs. Swarna S.A. Gunarathne |
| Hony. Secretary | - Mr. Ariyadasa Thanthrige |
| Hony. Asst. Secretary | - Mrs. K.L. G.G. Ranatunga |
| Hony. Asst. Secretary | - Mrs. Leela Mohana Sundaram |
| Hony. Treasurer | - Mr. R.D. Gunasena |
| Hony. Asst. Treasurer | - Mr. M. Madigasekara |
| Homy. Asst. Treasurer | - Mr. A.M.U. Tikiribanda |
| Hony. Committee Members | - Mr. P. Arunthavanathan |
| | Mr. K.B. Dissakaruna |
| | Mr. U.L.M. Naufur |
| | Mr. Hemasiri Ferdinando (chief editor) Sendewa) |
| | Mr. R.M. Seneviratne (Editor Sendawa) |
| Hony. Social Secretary | - Mr. Jagath Kariyawasam |
| Hony. Auditor | - Mr. K. Jeganathan |

# ANNUAL REPORT 2018

# CENTRAL BANK PENSIONERS' ASSOCIATION

Ariyadasa Thantrige
No. 104/8, Stanley Thilakaratne Mawatha,
Nugegoda.
Tel: 0112 811 049
Date : 06.04.2019

## Notice

The Annual General Meeting of the Association will be held on Saturday 06th April 2019 at the Center for Banking Studies, 58, Sri Jayawardanapura Mawatha, Rajagiriya.

Registration of Attendance will commence at 9.00 a.m

**AGENDA**

01. Lighting of the Traditional oil lamp
02. Observance of two minutes silence in memory all our departed colleagues.
03. Reading the minute of the previous AGM.
04. Matters arising from the minutes.
05. Presentation of the Annual report 2018 by the secretary.
06. Presentation of the Annual Financial Accounts 2018 by the Treasurer.
07. President's Address.

08. Resolutions
09. Election of Office Bearers for the year 2019
10. Any other business.

A tea with a snack will be served at the meeting. The meeting will be followed by the fellowship lunch and it is expected to conclude around 3.00 p.m.

Ariyadasa Thantrige
Hony. Secretary

# ANNUAL REPORT 2018

# CENTRAL BANK PENSIONERS' ASSOCIATION

Ariyadasa Thantrige
No. 104/8, Stanley Thilakaratne Mawatha,
Nugegoda.

Tel: 0112 811 049
Date : 06.04.2019

Dear Members,

## ANNUAL GENERAL MEETING 2018

We forward here with following documents for your information.

01. Notice Convening the Annual General Meeting.
02. Annual Report 2018
03. Statement of Annual Financial Accounts 2018.

You are cordially invited to attend the annual General Meeting of our Association scheduled to be held on 06th April 2019 at the Center for Banking Studies (CBS) of the Central Bank of Sri Lanka at No. 58, Sri Jayawardanapura Mawatha, Rajagiriya. (program agenda is attached)

Arrangements have been made to supply lunch free of charge for members at the canteen for Banking studies premises after the meeting.

Your Sincerely

Jayalal Jayawardena
Hon. President

Ariyadasa Thantrige
Secretary

# Annual Reports 2018/2019

I am pleased to present the Annual Report of the Association for the year 2018/2019. All of us served the Bank holding various positions sacrificing our prime period of life for the conduct of duties of the institution aimed at improving the life of public of the Motherland by meeting the objectives of the Bank. I would like to thanks the members for electing me as the General Secretory at the last AGM for a further period of one year.

I would like to thank and express my gratitude to our Governor Dr. Indrajith Kumarasamy and the Monetary Board for granting enhanced pension for the pensioners of CBSL. We all commend his desire to respect pensioners who had been working with him in the past.

We met Governor once and Mr. K.D. Ranasinghe (DG) three time s to discuss the problems of our members. These meeting were attended by Mr. Asoka Handagama (AG) and Mr. Abeykone (DHR) and Mr. D.W. Jinasena Director of Staff

Service Department. During these meetings we tried convince them for updating the pension, for the year 2015 & granting 70% percentage of the salary increase granted to the bank staff, to pensioners and we invited their attention to follow the same policy of updating in the future revisions.

During the year membership of the association has increased from 1080 to 1154. Membership of contributory Death Donation Scheme (CDD) has been increased from 644 to 698. A total sum of rupees 1.01 millions has been paid under CDD scheme. The Association paid Rs. 725,000 on account of deaths of 29 members, as a result of increase benefits approved at the last AGM - held on 23.04.2018. Our ultimate aim was to grant at least Rs. 100,000/- for the dependent of a member at member's death. Late Mr. B.P. Wimalasuriya should be remembered for pioneering this scheme.

During the period under review the responsibility of sending floral Wreath and expressing our condolences and of the Central Bank was carried out successfully.

Three editions of the ‘Sendewa’ magazine were issued during period. Our Associations expects to maintain this magazine in order to create awareness among the Central Bank Pensioners, regarding their problems and issues. Last Sendewa was delayed due to the delay in getting the details of the pension revision effective 2018. This however was not possible as the Central Bank Management did not inform the details. I would like to thank the editors of Sendewa Mr. Hemasiri Ferdinando & Mr. R.M. Senevirathna and the Sendewa committee for their excellent work in compiling the magazine of the Associations.

We had our one day outing and get together on 22nd Sep. 2018 at Amaya Green Weeragula, Yakkala attended by 125 members. Further a successful and enjoyable three day tour of Jaffna on 28th, 29th, 30th March 2018 was arranged and 100 members participated. We should thank the CBSL Management for granting a sum of rupees 288,400/- to meet the transport cost of the three day trip last year. This is the first time 100 members participated for a three day trip.

The executive committee of the Association continued to visit the elderly members and wish them good health.

We requested from Management that the medical benefit scheme for the pensioners should be revised upward to keep up with the present level of cost of living including transport cost as most of our members are old and need more medical related visits. Thankfully Governor promised to consider this request favorably. We earnestly expect this revision very early.

We donated a sum of Rs. 35,000/- for lunch for the inmates of the Apeksha Hospital Maharagama during 27$^{th}$ to 31$^{st}$ January 2019. We also contributed for religious activities in 2018 conducted in memory of Bank employees who lost their lives during the bomb blast on 31$^{st}$ January 1996.

We are pleased to announce that the pensioners' Hand Book will be distributed to members free of charge, who attend the AGM on 6$^{th}$ April 2019.

I thank the Governor Dr. I. Kumarasamy on behalf of executive committee for the attention he paid to our grievances and solving issues brought to his consideration. We are very much thankful to Mr. K.D. Ranasingha, Deputy Governor who coordinated regarding issues raised by the Association together with the Senior Officials of the Bank. I thank Mr. Abeykoon Director of HR, Mr. T.B.H. Sarathchandra Director of the Staff Service Department, Mr. A.W. Jinasena Former Secretor, Mrs. Kusum Dissanayake Secretary, Mrs. S. Gunawardane Director of Communication and its staff and the staff of Central Bank Press where the Sandewa Magazine is printed for us. It is our duty to thank and record our gratitude to Mr. K.B. Dissakaruna, (committee member) for having sacrificed his valuable time in getting out the New Hand Book (second edition) of the Association. Similarly we also salute Mr. Susantha Liyanage owner of the Sachin Auto a member of our Association, Commercial Bank Ltd, Hatton National Bank Ltd, Lotus Tours Nugegoda, and Mr. D. Jayawardana owner of Jayawardana

Pilgrim Travels also member of the Association for meeting the printing cost of the Hand Book. We wish them all success in their endeavors.

Also thanks for Mr. Jeganathan Honorable Auditor for discharging his responsibility as the auditor of Association.

Secretary.

**Independent Hony. Auditor's report the members of the Central Bank Pensioners' Association. Reports on the Financial Statement.**

I have audited the accompanying financial statement of the Central Bank Pensioners' Association which comprises the balance sheet as at 31st December 2018 and the income and expenditure and the explanatory notes to the Accounts. I have obtained all the information and explanation which to the best of my knowledge and belief where necessary for the purpose of my audit. The financial Statement is a fair presentation and is free from the material miss statement whether due to fraud and error.

In my opining so far as appears from my examination, the Association maintained proper accounting records for the year ended 31st December 2018 and the financial statement give a true and fair view of the Association's state of the affairs as at 31st December 2018 and it's income for the year.

Signed by,
Mr. K. Jeganathan
Hony Auditor
01.03.2019

## Central Bank Pensioners’ Association
## Income & Expenditure Account for the year ended 31.12.2018

| Expenditure | Note | 2018 | 2017 | Income | 2018 | 2017 |
|---|---|---|---|---|---|---|
| **Subsidized** | | | | | | |
| AGM (2017) | 1 | 289050 | 157765 | Pensioners’ Contribution | 1257000 | 1287700 |
| 3 Day Trip | 2 | - | 30250 | W&OP/WORP | 63000 | 84700 |
| 1 Day Trip | 3 | 114160 | 46795 | Contributory Death Donation | | 730900 |
| **Donation** | | | | | | |
| Death Donation | 4 | 725000 | 550000 | **Interest income** | | |
| Contributory Death Donation | - | - | 898000 | HNB fixed deposits | 294845 | 237257 |
| Visit sick persons | - | - | 11000 | HNB Savings | 1698 | 1672 |
| | | | | HNB Treasury Bills | 93269 | 107351 |
| **Other Expenses** | | | | Sampath Treasury Bill | 13480 | 13546 |
| Religious Activities | 5 | 80568 | - | Sampath Bank Savings A/C | 7781 | 6692 |
| Stamp & Postage | | 72756 | 72670 | | | |
| Type, Photocopy & Printing | | 36858 | 21713 | | | |
| Transport | | 18542 | 40088 | | | |
| Wreath Wright off | | 18050 | 24865 | | | |
| Refreshment | | 16948 | 5785 | | | |
| Miscellaneous | | 16600 | 2430 | | | |
| Sendewa | | 10608 | 23185 | | | |
| Regional Organization | | 7640 | 14595 | | | |
| Website | | 5000 | 5000 | | | |
| Stationary | | 4204 | 13625 | | | |
| Bank Chargers | | 900 | 1500 | | | |
| Depreciation | | 90 | 100 | | | |
| Income Over Expenses | | 314099 | 550452 | | | |
| Total | | **1731073** | **2469818** | | **1731073** | **2469818** |

President Treasurer Auditor

## Central Bank Pensioners' Association
## Balance sheet as at 31.12.2018

| **Liabilities** | **2018** | **2017** | **Assets** | **2018** | **2017** |
|---|---|---|---|---|---|
| Accumulated fund | 5101608 | 4551156 | Office equipment | 813 | 903 |
| Income over expenses | 314099 | 550452 | **Investments** | | |
| | | | Fixed Deposits HNB | 3396871 | 3107671 |
| Founds for needy persons | 6210 | 6210 | Treasury Bills HNB | 1308183 | 1214914 |
| Sponsors for Hand Book | 75000 | - | T.B. Sampath Bank | 146452 | 146453 |
| Contributory Death Donation Fund | 60750 | - | **Current Assets** | | |
| | | | Interest receivable | 53958 | 48313 |
| | | | Due from Central Bank | | |
| | | | on wreath | 87750 | 65600 |
| | | | **Bank Balances** | | |
| | | | HNB current Account | 307118 | 282377 |
| | | | HNB Savings Account | 53545 | 51846 |
| | | | Sampath Savings Account | 183975 | 162714 |
| | | | Cash in Hand | 19002 | 27027 |
| **Total** | | | | | |
| | **5557667** | **5107818** | | **5557667** | **5107818** |

President Treasurer Auditor

**Note 1** The Details of AGM Expenses held on 'Vidupiyasa' conference hall in No. 53, Sri Jayawardanapura Mw, Rajagiriya at date of 21.04.2018

| | | |
|---|---|---|
| Refreshment (Morning Tea & Lunch) | | Rs. 217,750.00 |
| Annual Report | | Rs. 60,500.00 |
| Other expenses | | Rs. 10,800.00 |
| | Total | Rs. 289,050.00 |

**Note 2** 3 day tour of Jaffna on the 28, 30, 31 March 2018. The cost of two buses were paid (Rs.288400/-) by the Central Bank. The summary of the account as follows.

| | | |
|---|---|---|
| Total receipts from participants | | Rs. 928,685.00 |
| Expenses | | |
| Lodging & Hotels | Rs. 784,822.00 | |
| Other expenses | Rs. 143,863.00 | |
| Total Expenses | | Rs. 928,685.00 |

**Note 3** One day Trip & Get together on 2.9.2018 at Weeragula close to Yakkala. Summary of the account as follows.

| | | |
|---|---|---|
| Total Receipts from Participants | Rs. 315,000.00 | |
| Expenses | | |
| Hotel changes & Lunch | Rs. 342,300.00 | |
| Transport | Rs. 50,000.00 | |
| Music | Rs. 15,000.00 | |
| Other expenses | Rs. 21,860.00 | |
| | | 429,160.00 |
| Subsidized by CBPA | | 114,160.00 |

**Note 5** Expenses for Religious Activities

| | |
|---|---|
| Donation for memorial Activities on behalf of Bomb Victims of 1996 | Rs. 45.568.00 |
| Donation Lunch Apeksa Hospital Maharagama on dated 27, 28, 29, 30, 31.12.2019 | Rs. 35,000.00 |
| | Rs. 80,568.00 |

**Note 4** During the year in 2018 Rs. 1,735,000/- was paid under Death Donation and Contributory Death Donation as Follows.

| | Pension No. | Name | D.D.F. | C.D.D. | Total |
|---|---|---|---|---|---|
| 01 | 1210 | Mrs. A.A. Wijewardana | 25000/- | | 25000/- |
| 02 | 350 | Mrs. B.G.M. Fernado | 25000/- | | 25000/- |
| 03 | 532 | Mr. J.M.A.M. Jayamanne | 25000/- | | 25000/- |
| 04 | 1442 | Mr. D.W.W.A.P. Piyasena | 25000/- | 65000/- | 90000/- |
| 05 | 3303 | Mr. R. Sunil | 25000/- | | 25000/- |
| 06 | 3366 | Mr. W.A. Piyadasa | 25000/- | 65000/- | 90000/- |
| 07 | 195 | Mrs. W.H. Attyagalle | 25000/- | 65000/- | 90000/- |
| 08 | 933 | Mr. N.S. Wijepala | 25000/- | 65000/- | 90000/- |
| 09 | 193 | Mr. P.M. Hassan | 25000/- | | 25000/- |
| 10 | 453 | Mr. N.P. Perera | 25000/- | | 25000/- |
| 11 | 950 | Mr. R.P. Chandrasena | 25000/- | 75000/- | 100000/- |
| 12 | 1376 | Mr. R.Ranasinghe | 25000/- | 75000/- | 100000/- |
| 13 | 597 | Mr. A.S. Jayawardana | 25000/- | | 25000/- |
| 14 | 635 | Mr. C.E. Jayasuriya | 25000/- | 75000/- | 100000/- |
| 15 | 938 | Mr. B.P. Wimalasuriya | 25000/- | | 25000/- |
| 16 | 662 | Mr. S.Karunarathna | 25000/- | | 25000/- |
| 17 | 731 | Mr. Asiri Perera | 25000/- | 75000/- | 100000/- |
| 18 | 683 | Mr. Basil Senevirathna | 25000/- | | 25000/- |
| 19 | 1451 | Mr. D.D.A. Dharmakeerthi | 25000/- | 75000/- | 100000/- |
| 20 | 1038 | Mr. W.M. Siriwardana | 25000/- | | 25000/- |
| 21 | 519 | Mr. S.N.L. Santhiyago | 25000/- | | 25000/- |
| 22 | 795 | Mr. P. Sundaranathan | 25000/- | | 25000/- |
| 23 | 3299 | Mr. V.S.L. De Mel | 25000/- | 75000/- | 100000/- |
| 24 | 818 | Mr. W.G. Chandrasena | 25000/- | | 25000/- |
| 25 | 852 | Mrs. S.P.S. Gunasekara | 25000/- | 75000/- | 100000/- |
| 26 | 396 | Mr. O.P.N. Kottachchi | 25000/- | | 25000/- |
| 27 | 751 | Mr. S.R.M. Sirisena | 25000/- | 75000/- | 100000/- |
| 28 | 868 | Mr. P. Sirisena | 25000/- | 75000/- | 100000/- |
| 29 | 765 | Mr. P.R.B. Alagakone | 25000/- | 75000/- | 100000/- |
| | | | 725000/- | 1010000/- | 1735000/- |

# Y%S ,xld uy nexl= úY%dñlhskaf.a ix.uh

# Central Bank Pensioners' Association

Secretay
104/8, Cooray Place,
Stanly Thilakarathna Mawatha,
Nugegoda.